(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 180.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 අප්‍රේල් මස 04 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1550/’11

1.

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයෙන් පසුව චීනය විසින් භාරගන්නා ලද ශ්‍රී ලංකා දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) ඉහත සඳහන් ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඇස්තමේන්තු කරන ලද මුළු මුදල හා ව්‍යාපෘතිය අවසන් වන විට වැය කොට තිබූ තථ්‍ය පිරිවැය කවරේද;

(iv) මෙම ව්‍යාපෘතියේ ශ්‍රමය සඳහා දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ සේවය කළ දේශීය හා විදේශීය ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට විදේශීය සේවකයින් ගෙන එන ලද සමාගම හෝ රට විසින් එම සේවකයින් හට ලබා දුන් තනතුරු නාමයන් කවරේද;

(iii) ශ්‍රී ලංකා දුම්රිය මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1589/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන කුරු/නික/මානපය කනිෂ්ඨ විද්‍යාලය වසා දමා වර්ෂ දහයකට අධික කාලයක් ගත වී ඇති බවත්;

(ii) මේ වන විට එම පාසල සතුව පැවති සියලු ගොඩනැගිලි දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර නැවත පාසල විවෘත කිරීමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එය විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම විද්‍යාලය නැවත විවෘත නොකරන්නේ නම්, එහි සම්පත් වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම අපේක්ෂිත කාර්යය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1693/'11

3.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "රක්නා ලංකා" ආරක්ෂක සේවයේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) "රක්නා ලංකා" ආරක්ෂක සේවය මගින් එක් එක් ආයතනයට ආරක්ෂාව සපයනු ලබන වාර්ෂික මිල ගණන්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ආයතනය වෙනුවෙන් ලබා දී ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රක්නා ලංකා ආරක්ෂක සේවයේ ආරක්ෂක නිලධාරියෙකු වෙනුවෙන් සේවාලාභීන් ගෙවනු ලබන මුදලින් රක්නා ලංකා ආයතනය විසින් ආරක්ෂක නිලධාරියෙකුට ගෙවනු ලබන මුදල කොපමණද;

(v) "රක්නා ලංකා" ආයතනයේ සේවය කරනු ලබන සියලු දෙනා රාජ්‍ය ආරක්ෂක සේවාවන්හි නිරත වූවන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1803/'11

4.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඳිකොලපැලැස්ස ග්‍රාම නිලධාරී වසමේ, ගැමුණුපුර වටරවුම් පාර "ගැමුණු ගොවි සංවිධානය" මගින් පිළිසකර කරන ලද බවත්;

(ii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සමග එම ගොවි සංවිධානය අත්සන් කරන ලද ගිවිසුමට අනුව අංක 419 දරන ගෙවීම් වවුචරයෙන් ඉටු කරන ලද වැඩ සඳහා රු. 801,089. 99ක් ලබා ගෙන ඇති බවත්;

(iii) ඉහත මාර්ගයේම මීටර් 665ක් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ගිවිසුම්ගත වැඩ සඳහාම "ගැමුණු ගොවි සංවිධානය" විසින් තණමල්විල ප්‍රාදේශීය සභාවෙන් රු. 588,858.25 ක් ලබාගෙන ඇති බවත්;

(iv) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයට අනුව එකම කාර්යයක් වෙනුවෙන් ආයතන දෙකකින් "ගැමුණු ගොවි සංවිධානය" නමින් වංචනික ලෙස මුදල් ලබාගෙන ඇති බව සනාථ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වංචනික ක්‍රියාවට වගකිව යුතු පුද්ගලයින්ට විරුද්ධව නීතිමය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1860/'11

5.

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වවුනියාව, කෝවිල්කුලම් ගම්මානයේ ළදරු පාසලක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකළ බවට ව්‍යාජ තොරතුරු දක්වා, සිදු නොකළ ඉදිකිරීමක් වෙනුවෙන් රු. 177,180.66ක මුදලක් වවුනියාව නගර සභාවෙන් වංචනිකව ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මුදල් ලබා ගත් අය කවුරුන්ද;

(ii) එම වංචනික ක්‍රියාව සිදුකළ තැනැත්තාගෙන් ඉහත මුදල ආපසු අයකර ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1862/'11

6.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) සේවකයින් බඳවා ගැනීම, ඉවත් කිරීම හා සේවය දීර්ඝ කිරීමේ පූර්ණ බලතල එම සමාගමේ පරිපාලනය සතුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැවිලි සමාගමේ වත්මන් සභාපතිවරයා වැවිලි ක්ෂේත්‍රය තුළ දූෂණ හා වංචා සිදු කළ අයෙකු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම දූෂණ හා වංචා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එම පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම පරීක්ෂණයෙන් එම සභාපතිවරයා වරදකරුවකු වුවහොත් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

(iv) එම සභාපතිවරයා ඉදිරිපත් කරන ඇල්කඩුව වැවිලි සමාගමේ ගිණුම් වාර්තා පිළිගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සමාගමේ 2007-2010 වර්ෂ තුළ ලාභ ලැබූ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) අලාභ ලැබුවේ නම්, එම අලාභය කොපමණද;

(iii) දූෂණ සහ අක්‍රමිකතා ඊට හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) (i) එම සමාගම සඳහා කෝප් වාර්තාවක නිර්දේශයක් පරිදි ආශ්‍රිත මෙහෙයුම් කාර්යාලයක් ඉදිකර තිබේද;

(ii) එය ඉදිකිරීමට හේතුව කවරේද;

(iii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) එම කාර්යාලයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1866/'11

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය වන විට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ඛනිජ තෙල් සංස්ථාවට අයවීමට ඇති ණය ප්‍රමාණයන් එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එම ණය අතුරින් ඛනිජ තෙල් සංස්ථාව වෙත ගෙවා ඇති ණය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අද වන විට ඛනිජ තෙල් සංස්ථාවට අය වීමට ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iv) මේ වන විටත් ණය ගෙවීම් සිදු කරන ආයතන තිබේද;

(v) එසේ නම්, එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ණය නොගෙවා සිටින ආයතනවලින් ඒවා අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1872/'11

8.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකන් ගුවන් සේවයට සහ මිහින් ලංකා ගුවන් සේවයට අයත් ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුවන් යානා අතුරින් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව ගුවන් සේවය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ගුවන් යානාව සඳහා මාසිකව ගෙවනු ලබන කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකන් ගුවන් සේවය පසුගිය වර්ෂ තුන තුළදී උපයා ගත් ශුද්ධ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ශ්‍රී ලංකන් ගුවන් සමාගමට ඉදිරි වර්ෂ පහක කාලයකට හා මිහින් ලංකා ගුවන් සමාගමට ඉදිරි වර්ෂ දෙකකට ලැබී ඇති ප්‍රාග්ධන ආයෝජන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රාග්ධන ආයෝජන ඉහත ගුවන් සමාගම් දෙකෙහි උන්නතිය සඳහා යෙදවීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1912/'11

9\.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ මුඩුක්කු සහ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලු විසඳීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, කොළඹ නගර සභාව සහ තිරසාර පුරවර වැඩසටහන සමග "රියල් එස්ටේට් එක්ස්චේන්ජ් පෞද්ගලික සමාගම" (REEL) ඒකාබද්ධ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) 2006 වර්ෂයේ සිට මේ දක්වා,

(i) REEL පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් සහ ප්‍රධාන ගණන්දෙන නිලධාරීන් කවුරුන්ද;

(ii) භාණ්ඩාගාරය, රාජ්‍ය බැංකු සහ රාජ්‍ය ආයතන විසින් REEL වෙත පවරන ලද අරමුදල් පිළිබඳ තොරතුරු කවරේද;

(iii) එක් එක් පැවරුමේ අරමුණ සහ ප්‍රක්ෂේපිත සහ තථ්‍ය ප්‍රතිඵල කවරේද;

(iv) මිලියන පහ ඉක්මවූ පිරිවැය අයිතම පිළිබඳ තොරතුරු සහ එක් එක් අනුමතියේ අරමුණු කවරේද;

(v) REEL හි වර්තමාන මූල්‍යමය තත්ත්වය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 ජනවාරි සිට මේ දක්වා REEL හි කවර හෝ පමණ ඉක්මවා වියදම් කිරීම්, වංචා සහ/හෝ දූෂණ පිළිබඳ යම් අභ්‍යන්තර පරීක්ෂණ, විගණන හෝ අපරාධ විමර්ශණ සිදු වී ඇත්ද;

(ii) එසේ නම්, ඒවායේ ප්‍රතිඵල කවරේද;

(iii) ඉහත (ඇ) (i) පරිදි නිරීක්ෂිත විෂමාචාර සම්බන්ධයෙන් යෝජිත විසඳුම් ක්‍රියාමාර්ග සහ එකී දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2024/'11

10\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂය තුළ ලබා දී ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම මුදල් යොදා සකස් කොට ඇති මාර්ග කවරේද;

(iii) එකී එක් එක් මාර්ගයේ කාපට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iv) එම කාපට් ඇතිරීම සඳහා භාවිතා කළ කාපට් මිශ්‍රණ කියුබ් ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග කාපට් ඇතිරීම සිදුකළ කොන්ත්‍රාත් සමාගම හෝ සමාගම් කවරේද;

(ii) එකී එක් එක් සමාගම වෙත එම කොන්ත්‍රාත් ලබා දීමට අදාළව ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

(iv) ගිවිසුම් අත්සන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කොන්ත්‍රාත් ලබා දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද;

(ii) එසේ නොමැති නම්, කොන්ත්‍රාත් ලබාදීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත කී ව්‍යාපෘතිවලදී සිදුවිය හැකි අක්‍රමිකතා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2066/'11

11.

ගරු ඒ. විනායගමූර්ති මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාවේ, තච්චන්කුලම්හි පිහිටි බස්තියම්පිල්ලේ ජෝසප් පීටර් මහතාට අයත් අක්කර දහයක වපසරියක් ඇති "පීටර්ස් ෆාම්" නැමති ගොවිපල [අංක 7 එස්. පී. 4739 දරන පිඹුරේ ලොට් අංක 797 ලෙස සඳහන් වන] වවුනියා ගුවන්තොටුපළ පුළුල් කිරීම සඳහා 1986දී අත්පත් කරගත් බවත්;

(ii) 1986දී අත්පත් කරගත් එම ඉඩම සඳහා ගෙවිය යුතු වන්දි මුදල මේ දක්වා ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බස්තියම්පිල්ලේ මහතා මියගොස් ඇති බැවින් ඉහතකී වන්දි මුදල ඔහුගේ බිරිඳ සහ දියණිය වෙත ගෙවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2085/'11

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වලව ව්‍යාපාරයට අයත් රිදියගම වැව යටතේ සංවර්ධනය වන වගා බිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජලාශයේ ජලය හම්බන්තොට ඉදිවෙමින් පවතින වරාය ඇතුළු සංවර්ධන කලාපයට ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ලබා ගැනීමට අපේක්ෂිත ජල ධාරිතාව අක්කර අඩි කොපමණද;

(iv) එම ජලය රිදියගම ජලාශයෙන් ලබා ගන්නේ නම්, එම වැව යටතේ වගා කටයුතුවල යෙදෙන ගොවීන්ගේ වගාවන්ට ජල හිඟය නිසා සිදුවිය හැකි හානි වැළැක්වීම පිණිස ගනු ලබන පියවර කවරේද;

(v) එම ජල සැපයුම ලබා දීම පිණිස රිදියගම ජලාශයට අවශ්‍යතරම් ජලය ලබා ගත හැකි විකල්ප මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(vi) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

(vii) ඊට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/'11

13.
ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් සහ එහි කවර හෝ නියෝජිත ආයතනයක් විසින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ හිමිකාරීත්වය දරනු ලබන මූල්‍ය සහ/හෝ අරමුදල් කළමනාකරණ සමාගම්වල නම් කවරේද;

(ii) මෙම එක් එක් සමාගමෙහි නිකුත්කළ ප්‍රාග්ධනය කවරේද;

(iii) අවසන්වරට නිකුත් වූ අදාළ සහතික කරන ලද ශේෂ පත්‍රයන්හි සඳහන් පරිදි මෙම එක් එක් සමාගමෙහි සමස්ත වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත කී සමාගම්වල පවතින අධ්‍යක්ෂ මණ්ඩල කීපයෙහි සිටින එක් එක් සාමාජිකයාගේ නම, තනතුර සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2145/'11

14.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාතෙහි, වැලිමඩ, සිල්මියාපුරයේ පවුල් පන්සියයකට අයත් ජනතාවට දැනට ලැබෙන ජල සැපයුම, ඔවුන්ගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවන බව එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රමාණවත් පරිදි ජලය ලබාගැනීම සම්බන්ධයෙන් සිල්මියාපුර පවුල් මුහුණ දෙන දුෂ්කරතාවයන් දුරු කිරීම පිණිස, ඉහත කී ජල සැපයුම වැඩිදියුණු කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2012 මැයි මස 08 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

3.

ගරු ජෝන් අමරතුංග මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2012 මාර්තු 09 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යාවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යාවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

ටී. බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**